GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

11-09-2012

## මාධ්‍ය නිවේදනය

**කොළඹ මහනගර සභාවේ සේවය කරන රජයේ වෛද්‍ය නිලධාරීන් සඳහා සන්නිවේදන දීමනාව , බාධා කිරීමේ රැඳිසිටීමේ හා ප්‍රවාහන දීමනාව නොගෙවීම**

කොළඹ මහ නගර සභාව තුල සෞඛ්‍ය අමාත්‍යංශයට අනුයුක්ත රජයේ වෛද්‍ය නිලධාරීන් පනස් දෙදෙනෙකු පමණ සේවය කරන අතර ඔවුන් රෝග නිවාරණ දෙපාර්තුමේන්තුවට අනුයුක්තව වෛද්‍ය සායන වලද, ප්‍රජා සෞඛ්‍ය දේපාර්තුමේන්තුවට අනුයුක්තව මාතෘ සායන , මාතෘ නිවාස ,ළමා සායන, ප්‍රතිශක්තිකරණ සායන හා රෝග මර්ධන (Preventive) අංශ වලද කොළඹ මහ නගර සභා සීමාව තුල විශාල සේවාවක් සපයනු ලබයි.

මෙම නිලධාරීන් සඳහා පසුගිය ජනවාරි මස සිට ගෙවීමට නියමිතව තිබූ බාධා කිරීමේ රැඳිසිටීමේ හා ප්‍රවාහන දීමනාව(DAT) හා සන්නිවේදන දීමනාව පසුගිය මාසය වන තෙක් ගෙවා නොතිබුණි. නගරාධිපතතුමා හා අදාල නිලධාරීන් සමඟ රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය 2012-07-18 පැවැත්වූ සාකාච්ජාවකින් මෙම දීමනා ගෙවන බවට වාචික පොරොන්දුවක් ලැබුණු නමුත් DAT දීමනාව පමණක් මෙම නිලධාරීන් සඳහා 2012 අගෝස්තු මාසයේ දි ගෙවන ලදි. නමුත් සංනිවේදන දීමනාව මෙතෙක් ගෙවීමට කටයුතු කර නොමැත.

මෙම දීමනාව ලබා දෙන ලෙස රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් දිගින් දිගටම ඉල්ලීම කරන ලදමුත් මෙතෙක් කොළඹ මහ නගර සභාවේ නිලධාරීන්ගෙන් කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත. මේ නිසා මෙම දීමනාව 2012 සැප්තැම්බර් 14 දිනට පෙර ගෙවන ලෙස රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය ඉල්ලා ඇත. කොළඹ මහ නගර සභාව මෙම ඉල්ලීමට ප්‍රතිචාර දැක්වීමට අපහසු වුවහොත් එහි සේවය කරන සියළුම රජයේ වෛද්‍ය නිලධාරීන් 2012-09-17 දිනට එම සේවා වලින් ඉවත් කර ගැනීමට රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය තිරණය කොට ඇත.

එසේ වුවහොත් කොළඹ මහ නගර සභාව මගින් සපයන සියළුම රෝගී සත්කාර සේවා නවතින අතර සියළුම වෛද්‍ය සායන, අක්ෂි සායන , මාතෘ සායන මාතෘ නිවාස හා ළමා සායන හා ප්‍රතිශක්තිකරණ සායන 2012-09-17 දින සිට වැසී යාමට නියමිතය. එසේම රෝග නිවාරණ සේවාවන් අඩාල වීම මගින් සියළුම සෞඛ්‍ය රක්ෂණ සේවාවන් නවතින අතර කොළඹ මහ නගර සභාව තුල ඩෙංගු මර්ධන කටයුතු සම්පුර්ණයෙන් ඇන හිටිනු ඇත.

ස්තුතියි

වෛද්‍ය චන්දික එපිටකඩුව
ලේකම්

| | | |
|---|---|---|
| වැඩි විස්තර - | වෛද්‍ය නලින් ආරියරත්න | 0714800942 |
| | වෛද්‍ය නවීන් ද සොයිසා | 0718582444 |
| | වෛද්‍ය නලින්ද හේරත් | 0717876516 |